# දැන්වීමයි

## ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම - 2021/2021
## මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය

තැපැල් පසහුකම් අවහිර වීම හේතුවෙන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් එවීමට නොහැකි වූ සිසුන් හට ඔබේ අයදුම්පත විද්‍යුත් තැපෑල මගින් යොමු කිරීමේ හැකියාව ඇත. ඒ අනුව නිසි පරිදි සම්පූර්ණ කල අයදුම්පත සමග අ.පො.ස. උසස් පෙළ ප්‍රතිපල ලේඛනයේ සහතික කල පිටපතක් PDF ආකෘතියෙන් තනි ලේඛනයක් ලෙස **ndt2021@itum.mrt.ac.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට **2020 දෙසැම්බර් 07** වන දිනට පෙර යොමු කිරීමෙන් ඔබට මේ සඳහා අයදුම් කල හැකිය.

**ඉතා වැදගත්:**

1. දැනටමත් තැපැල් මගින් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත විද්‍යුත් තැපෑලෙන් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතුය.
2. රටේ දැනට පවත්නා තත්වය හේතුවෙන් තැපැල් මගින් අයදුම්පත් එවීමේ දුෂ්කරතා ඇති අයදුම් කරුවන්ට පමණක් මෙම පහසුකම ලබා දී ඇත්තේ අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය සඳහා පමණි ඒ අනුව විද්‍යුත් තැපෑල මගින් අයදුම්පත් ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් ඔබගේ අයදුම්පතෙහි මුල් පිටපත **2020 දෙසැම්බර් 31** දිනට පෙර තැපැල් මගින් අප වෙත එවිය යුතු බව කරුණාවෙන් සලකන්න.

සියලුම අයදුම් කරුවන් තම අයදුම්පත්‍රය විද්‍යුත් තැපෑල මගින් යොමු කිරීමේදී පහත දැක්වෙන උපදෙස් දැඩි ලෙස පිළිපැදිය යුතු බව සලකන්න.

1. එක් අයදුම්කරුවෙකු ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. (ඔබ අයදුම්පත් කීපයක් යොමු කර ඇත්නම්, පළමුවන ඉදිරිපත් කිරීම පමණක් සලකා බලනු ඇති බව කරුණාවෙන් සලකන්න.)
2. අයදුම්කරුවන් විසින් නිසි පරිදි පුරවන ලද අයදුම්පත්‍රය සහ අ.පො.ස. උසස් පෙළ ප්‍රතිපල ලේඛනයේ පිටපතක ස්කෑන් කරන ලද පිටපතක් එක් ලේඛනයක් ලෙස PDF ආකෘතියෙන් යොමු කල යුතු වේ.
3. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය විද්‍යුත් තැපෑලෙහි විෂය ලෙස දැක්විය යුතු අතර ලිපිගොනුව නම් කිරීමේදී එය අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකයෙන් නම් කල යුතු වේ.
4. අයදුම්කරුවන්ගේ මුලකුරු සහිත නම සහ ජාතික හැඳුනුම්පත් අංකය විද්‍යුත් තැපෑලෙහි පණිවිඩය ලෙස සඳහන් කළ යුතුය.

**(වැඩි විස්තර සඳහා කරුණාකර ඇමුණුම 01 හි ඇති නිදර්ශක විද්‍යුත් තැපෑල සහ http://www.itum.mrt.ac.lk/ වෙබ් අඩවියේ සඳහන් කර ඇති ගැසට් නිවේදනය බලන්න.)**

නිසි බලධාරී
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය
27.11.2020

## ඇමුණුම 01


1234567890V
ndt2021@itum.mrt.ac.lk
1234567890V
Name With Initials: S. Perera
NIC Number: 1234567890V
123467890V.pdf (380K)
Sans Serif
Send